දරිද්‍රතා සංක්ෂිප්ත







# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ විශ්ලේෂණය - 2013

සංක්ෂිප්ත ප්‍රකාශන මාලාව
අංක 13 - 2014

cepa
centre for poverty analysis

# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ විශ්ලේෂණය - 2013

ශකීලා ජබ්බාර් සහ දිනුෂ්කා සේනානායක

සංශෝධනය කලේ
ඉෂාරා රත්නායක

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (CEPA) ප්‍රකාශනයක්

සංක්ෂිප්ත ප්‍රකාශන මාලාව
අංක 13 - 2014

© Centre for Poverty Analysis 2014

ISBN 978-955-1040-66-6

දරිද්‍රතාවය පිළිබඳ එළිදක්වනු ලබන සංක්ෂිප්ත ප්‍රකාශනයන්, දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ ප්‍රකාශන මාලාවේ එක් අංශයක් වන අතර, එමගින් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය විසින් ජනනය කරන, නොයෙකුත් විෂයන්ට අදාළ තොරතුරු නිසි කලට කඩිනමින් ප්‍රචාරණය කිරීමට බලාපොරොත්තු වේ.

සංක්ෂිප්ත ප්‍රකාශන මාලාවට කොටස් 3ක් ඇතුලත් වේ.

1) **දරිද්‍රතා සංක්ෂිප්තයන්** - මේවා අදාළ ක්ෂේත්‍රයේ විශේෂිත දැනුමකින් යුතු කණ්ඩායම් මෙන්ම එවැනි විශේෂිත නොවූ කණ්ඩායම්ද ඉලක්ක කරගනු ලබන අතර විධිමත් හා සවිස්තරාත්මක අන්දමින් ලියැවී ඇත.

2) **ප්‍රතිපත්ති සංක්ෂිප්තයන්** - මේවා ඍජුවම ප්‍රතිපත්ති හා සම්බන්ධවන අතර දරිද්‍රතාවය සහ සංවර්ධනය යන කරුණු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන රජයේ, රාජ්‍ය නොවන අංශයේ ආයතන හා පර්යේෂණ සහ අරමුදල් සපයන සංවිධාන ඉලක්ක කරගෙන සැකසී ඇත.

3) **තේමාත්මක සංක්ෂිප්තයන්** - විශේෂඥයන්ට මෙන් ම විශේෂඥ නොවන පාඨක පිරිසකට තොරතුරු සැපයීම අරමුණු කර ගත් මේවා විසින් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ තේමාත්මක කලාප පහේ ප්‍රශ්න ආවරණය කරයි. ඒවා තේමාත්මක කලාප පහට අයත් වන ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව හා අසමානතාව සමග ඍජුව සම්බන්ධ වන ප්‍රශ්න හදාරයි.

**ජබ්බාර් ශකීලා**
ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ විශ්ලේෂණය 2013 / ශකීලා ජබ්බාර්, දිනුෂ්කා සේනානායක; සංශෝධනය ඉෂාරා රත්නායක - කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය - 2014
පි. 21; සෙමි. 21 .- (සංක්ෂිප්ත ප්‍රකාශන මාලාව ; අංක 13)

ISBN 978-955-1040-66-6

I 362.5095493 DDC 23
ii. මාතෘකාව
iii. සේනානායක, දිනුෂ්කා සම කතෘ
iv. රත්නායක, ඉෂාරා
v. ග්‍රන්ථමාලාව
1. දරිද්‍රතාවය - ශ්‍රී ලංකාව

# පෙරවදන

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) විසින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ විශ්ලේෂණයක් මුලින්ම පළකරන ලද්දේ 2004 අගෝස්තු මාසයේදීය. දරිද්‍රතාවය පිළිබඳ තොරතුරු සහ දැනුම කළමනාකරණ වැඩ සටහනේ (PIK) ශකීලා ජබ්බාර් සහ දිනුෂ්කා සේනානායක විසින් මෙම ප්‍රකාශනය සම්පාදනය කරන ලදී. වසර 10 කට පසුව මෙම ප්‍රකාශනය වර්තමානයට ගැලපෙන ලෙස සහ යාවත්කාලීන කිරිමේ අවශ්‍යතාවය දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය හඳුනා ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ විශ්ලේෂණය - 2013 මගින් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, දරිද්‍රතාවය නිර්වචනය කිරීමට, මැනීමට සහ අධීක්ෂණය කිරීමට යොදාගනු ලබන්නා වූ විවිධ මූල්‍යමය සහ මූල්‍යමය නොවන ප්‍රවේශයන් කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙහිදී ශ්‍රී ලංකාවේදී යොදාගන්නා ලද ක්‍රමවේදයන් පරීක්ෂාකර බැලීම සහ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය ජාතික, දිස්ත්‍රික්ක, පළාත් සහ අංශ අනුව මැනගන්නා වූ ආකාරය සාකච්ඡාවට භාජනය කරනු ලබයි. එසේම විවිධවූ සමාජ ආර්ථික තත්වයන්ට අයත් කණ්ඩායම් වල දරිද්‍රතා මට්ටම් වලට බලපෑම් කරන්නාවූ අධ්‍යාපනය, සෞඛ්‍ය, ජිවන තත්වයන් සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ නවතම ප්‍රවනතා යන සාධකද මෙම සංක්ෂිප්ත ප්‍රකාශනයේදී විමසීමට ලක්කර ඇත.

මෙම සංක්ෂිප්තයේ දෙවන වෙළුම යාවත්කාලීන කරන ලද්දේ ඉෂාරා රත්නායක විසිනි. රොමේෂන් කුලසබානාදන් සහ ගීතා මායාදුන්නේ යන අය විසින් ලබාදුන් සහයෝගයට කතෘවරිය තම කෘතඥතාවය පිරිනමනු ලබයි.

මෙම ප්‍රකාශනය මුද්‍රණය කිරීමට සහ සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම සඳහා අරමුදල් සැපයූ Think Tank Initiative (TTI) ආයතනයට දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය ස්තුතිය පුදකර සිටී.

මෙම ප්‍රකාශනයේ සඳහන් වන අදහස් සහ මත කතෘවරියගේ ඒවා වන අතර එමගින් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය දරන අදහස් පිළිඹිබු විමක් සිදු නොවේ.

ශකීලා ජබ්බාර් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ට පර්යේෂිකාවකි. ඇය 2001-2005 කාලය තුළ දරිද්‍රතා තොරතුරු හා දැනුම කළමනාකරණ වැඩසටහනේ සේවය කළා ය.

දිනුෂ්කා සේනානායක දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ කණිෂ්ට පර්යේෂිකාවකි. ඇය 2004දී දරිද්‍රතා තොරතුරු හා දැනුම කළමනාකරණ වැඩසටහනේ සේවය කළා ය.

ඉෂාරා රත්නායක කොළඹ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ පර්යේෂිකාවකි. ඇය දරිද්‍රතා ඇගයීම් හා මිනුම් වැඩසටහනේ කොටස්කාරියකි. කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව සම්බන්ධයෙන් විශේෂිතව කෘෂිකර්මය පිළිබඳ දර්ශනපති උපාධිධාරිනියක් වන ඇය දරිද්‍රතාව හා කෘෂිකර්මාන්තය සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් කටයුතු කර තිබේ.

මෙම ප්‍රකාශනයේ භාවිතා කර තිබෙන ඡායාරූප දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය විසින් ගන්නා ලදී.

# පටුන

පෙරවදන 3

පටුන 5

01. දරිද්‍රතාවය ඇස්තමේන්තු කිරීම සඳහා වූ ප්‍රවේශයන් 7

02. මූල්‍යමය ප්‍රවේශය සහ මිනුම් 8

03. මූල්‍යමය නොවන ප්‍රවේශයන් සහ මිනුම් 11

04. ජනවිකාස ලක්ෂණ 14

5. දරිද්‍රතා මට්ටම් 14

5.1 ජාතික මට්ටමේ දරිද්‍රතාවය 14

5.2 දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ දරිද්‍රතාවය 15

5.3 ආංශික දරිද්‍රතාවය 17

06. සමාජ ආර්ථික තත්වයන් 18

6.1 අධ්‍යාපනය 18

6.2 සෞඛ්‍යය 19

6.3 ජීවන තත්වයන් 20

6.4 ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ ප්‍රගතිය 20

7. ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය 22

8. සාරාංශය 23

විමර්ශන/වැඩිදුර කියවීම් 24

## 01. දරිද්‍රතාවය ඇස්තමේන්තු කිරීම සඳහා වූ ප්‍රවේශයන්

විවිධ වූ පැතිකඩයන් ගෙන් සමන්විත ඉතා සංකීර්ණ සංසිද්ධියක් වන දරිද්‍රතාවය පැහැදිලි කිරීම සහ මැනීම හුදු එක් ප්‍රවේශයකින් හෝ දර්ශකයකින් සිදුකළ නොහැකි බව හොඳින් හඳුනාගෙන ඇත. දරිද්‍රතාවය නිර්වචනය කිරීමට, මැනීමට, අධීක්ෂණය කිරීමට ප්‍රධාන ප්‍රවේශයන් සතරක් තිබේ. ඒවානම් මූල්‍යමය ප්‍රවේශය, ශක්‍යතා ප්‍රවේශය, සමාජයෙන් බැහැරකිරීමේ ප්‍රවේශය සහ සහභාගිත්ව ප්‍රවේශයයි. පැහැදිලි අඩුපාඩුකම්/සීමාවන් පවතින නමුත් මූල්‍යමය ප්‍රවේශය මෙම ප්‍රවේශයන් අතරින් පුළුල් වශයෙන් භාවිතාවන ජනප්‍රිය ප්‍රවේශයකි. මූල්‍යමය නොවන අනෙකුත් ප්‍රවේශයන් (ශක්‍යතා ප්‍රවේශය, සමාජයෙන් බැහැරකිරීමේ ප්‍රවේශය සහ සහභාගිත්ව ප්‍රවේශය) යොදාගැනීම මෑතකදී ආරම්භ විය.

මූල්‍යමය ප්‍රවේශයේදී සැලකිල්ල යොමුවන්නේ අහිමි කිරීමේ ආර්ථිකමය මානයන් වන ආදායම සහ වියදම වැනි කරුණු පිළිබඳවය. ශක්‍යතා ප්‍රවේශයේදී අධ්‍යාපනය, සෞඛ්‍ය, පරිසරය සහ සවිබල ගැන්වීම වැනි කරුණු වල පවතින මූලික අහිමි කිරීමේ තත්වයන් සම්බන්ධව අවධානය යොමුකරනු ලබයි. සමාජයෙන් බැහැර කිරීමේ (කොන් කිරීමේ) ප්‍රවේශය මගින් ප්‍රධාන ධාරාවේ සමාජයට පුද්ගලයින් සහභාගීවීම හෝ ඇතුළත් කරගැනීම විමසා බලනු ලබයි. සහභාගිත්ව ප්‍රවේශය ජනතාවගේ අවබෝධය මත පදනම්ව ඇති බැවින් එය පුද්ගලනිශ්‍රිත/පුද්ගලානුබද්ධ වේ.

සාමාන්‍යයෙන් දරිද්‍රතාවය යන්නෙන් නිරපේක්ෂ හා සාපේක්ෂ වශයෙන්වූ අහිමි කිරීමේ තත්වයක් අදහස්වේ. නිරපේක්ෂ දරිද්‍රතාවය යනුවෙන් අදහස් වන්නේ භෞතික යහපැවැත්මක් සඳහා වන අවම අවශ්‍යතාවලටත් වඩා පහල යැපුම් තත්වයක සිටීමයි (Chronic Poverty Research Centre, 2001). නිරපේක්ෂ දරිද්‍රතාවය මැනීමේදී බොහෝ අවස්ථාවලදී අවම පරිභෝජන අවශ්‍යතා කාණ්ඩයක් ලබාගැනීමට, ගෘහ කුටුම්භයකට ඇති හැකියාව සලකා බැලීමට ලක්කෙරේ. සාපේක්ෂ දරිද්‍රතාවයේදී ආදායම් හෝ පාරිභෝජන මට්ටම් ජාතික මට්ටමේ සාමාන්‍යය අගයේ කොටසකට වඩා අවම මට්ටමක් ගැනීම අදහස්වේ. වෙනත් වචන වලින් පවසන්නේ නම් සාපේක්ෂ දරිද්‍රතාවය යනුවෙන් අදහස් වන්නේ "පුද්ගලයකුගේ හෝ කුටුම්භයක පවත්නා අහිමි කිරීමේ (හෝ යහපැවැත්ම නොමැතිවීම) තත්වය සමාජයේ අනෙකුත් අයගේ තත්වයන් හා සාපේක්ෂව සසඳා බැලීම මගින් තීරණය කිරීමයි" (ගුණවර්ධන 2004). එමනිසා සාපේක්ෂ දරිද්‍රතාවය යන්න විශ්ලේෂණයේදී ආදායම් අසමතාවය පිළිබඳව අවධානය යොමු කරනු ලබයි. අමාත්‍යා සෙන් (1999) සඳහන් කරන්නේ ආදායම සම්බන්ධයෙන් පවත්නා සාපේක්ෂ දරිද්‍රතාවය ආදායම යහපැවැත්ම බවට පරිවර්තනය කිරීමට පුද්ලගලයා තුල පවත්නා හැකියාව මත එනම් උදාහරණ වශයෙන් සෞඛ්‍ය තත්වයන්, වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමාජ හා පරිසර විද්‍යාත්මක තත්වයන් මත නිරපේක්ෂ ඌනතාවක් (හිඟකමක්) බවට පත්විය හැකි බවය.

## 02. මූල්‍යමය ප්‍රවේශය සහ මිනුම්

බොහොමයක් අවස්ථාවන්හිදී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මැනීම ගණනය කරනු ලබන්නේ මූල්‍යමය මිනුම් උපයෝගී කරගෙනය. මූල්‍යමය ප්‍රවේශයේදී දරිද්‍රතාවය යන්න දරිද්‍රතා රේඛාවට අදාලව අදායමේ හෝ පරිභෝජනයේ ඇතිවන හිඟයක් ලෙස විග්‍රහ වන අතර මෙහිදී ආදායම සහ වියදම පිළිබඳ මිනුම් අවධානයට යොමු කරගනු ලබයි. මෙම ප්‍රවේශයට අනුව දරිද්‍රතාවය යනු පිළිගත හැකි මට්ටමේ යහපැවැත්මක් පවත්වා ගැනීම සඳහා වූ අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් නොමැතිවීම හෝ ඒවා ලබාගැනීමට නොහැකිවීමයි (අලයිලිමා 2007). මෙම ප්‍රවේශයේදී ප්‍රමාණාත්මක දත්ත එක්රැස් කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ ක්‍රම භාවිතා කරනු ලබන අතර නිරපේක්ෂ සහ සාපේක්ෂ මිනුම් උපයෝගී කරගනු ලැබේ. සංවර්ධනය වූ රටවල් බොහොමයක් සාපේක්ෂ දරිද්‍රතා මට්ටම් භාවිතා කරන අතර සංවර්ධනය වෙමින් පවත්නා රටවල නිරපේක්ෂ දරිද්‍රතා රේඛාව භාවිතා කරනු ලබයි.

### 2.1 නිරපේක්ෂ සහ සාපේක්ෂ දරිද්‍රතාවය

කිසියම් කුටුම්භයක මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන සම්මත භාණ්ඩ හා සේවාවන් ප්‍රමාණයක් පදනම් කරගෙන නිරපේක්ෂ දරිද්‍රතා රේඛාව සැකසී ඇත. දියුණුවෙමින් පවත්නා රටවල ආදායම් පිළිබඳ දත්ත සමීක්ෂණවලදී ඌන නිමානය කිරීමකට ලක්වන නිසා දිගුකාලීන ආදායම් තත්වයන් සහ ජීවන තත්වයන් මැනගැනීමට සාමාන්‍යයෙන් පිළිගත් ක්‍රමය වන්නේ පරිභෝජන/වියදම් දත්ත සැලකිල්ලට ගැනීමයි.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතා රේඛාවේ ව්‍යුත්පත්තිය පසුගිය වර්ෂ වලදී වෙනස්වීමට ලක්වූ අතර එබැවින් නිත්‍යානුකූල ලෙස පිළිගතහැකි දරිද්‍රතා රේඛාවක් නොමැතිවිය. ජන හා සංඛ්‍යාල්බන දෙපාර්තමේන්තුව විසින් 2002 වසරේ පාරිභෝජන දත්ත උපයෝගී කරගෙන නිලවශයෙන් ජාතික දරිද්‍රතා රේඛාව ප්‍රකාශයට පත්කිරීමත් සමගින් 2004 වසරේදී දරිද්‍රතා පිළිබඳ පර්යේෂණ වල ප්‍රධාන වෙනස්කම් ඇතිවිණි. මෙම දරිද්‍රතා රේඛාව සකස් කරන ලද්දේ මූලික අවශ්‍යතා සඳහා යන වියදම් ක්‍රමය පදනම් කරගෙනය (CBN)[1].

අනෙකුත් සමීක්ෂණ වසරවල මෙම දරිද්‍රතා රේඛාව සකසන ලද්දේ 2002 වසරේ දරිද්‍රතා රේඛාව කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ (CCPI) උද්ධමනයට අනුව යාවත්කාලීන කිරීම මගිනි. මූල්‍යමය ප්‍රවේශයේදී දරිද්‍රතාවය මිනුම් කිරීමට වැඩි වශයෙන්ම යොදාගනු ලබන්නේ ෆොස්ටර්-ග්‍රීයර්-තොර්බෙක් ක්‍රමය (FGT) වන අතර

---

[1] ආහාර දරිද්‍රතා රේඛාව ගණනය කරනු ලබන්නේ පුද්ගලයකුගේ අවම කැලරි අවශ්‍යතාවය ලබාගැනීමට අවශ්‍ය ආහාර ගොනුව ලබාගැනීමට වැය වන මුදල තක්සේරු කිරීම මගිනි. එයට ආහාරමය නොවන ද්‍රව්‍ය වන නිවාස, ඇඳුම්, ප්‍රවාහනය ආදිය එකතු කිරීම මගින් මූලික අවශ්‍යතාවලට යන වියදම ඇස්තමේන්තු කරනු ලැබේ. මෙම ක්‍රමය ආහාර ශක්තිය අනුභව ක්‍රමය (FEI) සහ ඍජුව කැලරි අනුභව ක්‍රමය (DCI) ආදී ක්‍රම වලට වඩා ඉදිරියෙන් සිටී (ගුණවර්ධන 2005).

මෙමගින් දරිද්‍රතාවයේ විශාලත්වය, ගැඹුර සහ බරපතළ බව මනිනු ලබයි. ශ්‍රී ලංකාවේ නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද දරිද්‍රතා රේඛාවේ අගය (OPL) (එක් පුද්ගලයෙකු වෙනුවෙන් මාසයකට වැය වන සත්‍ය මුළු වියදම) 2009/10 වර්ෂ සඳහා රුපියල් 3028 කි.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ අධ්‍යයන වැඩි ප්‍රමාණයකදී අවධානය යොමු කරන්නේ නිරපේක්ෂ දරිද්‍රතාවය පිළිබඳව වුවත් ශ්‍රී ලාංකික සන්ධර්භයේ සාපේක්ෂ දරිද්‍රතාවය පිළිබඳ වැදගත්කම වේගයෙන් ඉහළ යමින් තිබේ. සාපේක්ෂ දරිද්‍රතාවය යනුවෙන් හැඳින්වෙන්නේ ජාතික මට්ටමේ සාමාන්‍යයේ යම් ප්‍රතිශතයට වඩා ආදායම හෝ පරිභෝජන මට්ටම් වල අඩු බවක් පැවැතීමයි. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ දරිද්‍රතාවය මැනීම සඳහා වඩාත් හොඳම මිනුම් වශයෙන් හැඳින්විය හැකි ඒවා (දැනට තිබෙන දත්ත අනුව) පහත දැක්වේ.

- ගිනි සංගුණකය (Gini co-efficient)
- ඒක පුද්ගල ආදායම ආදායම් දශමකයට අනුව[2]
- කුටුම්භයක වියදම වියදම් දශමකයට අනුව

ගිනි සංගුණකය මගින් දරිද්‍රතාවය මිනුම් කිරීමට වඩා සාම්ප්‍රදායික ලෙස ආදායම් විෂමතාවන් මිනුම් කරන නමුත් එය සාපේක්ෂ දරිද්‍රතාවය මිනුම් කිරීම සඳහා භාවිතා කරනු ලබන සාධාරණ නියෝජනයක් ලෙස සැලකේ. මෙම සංගුණකය 0 සහ 1 අතර පිහිටන අංකයක් වන අතර එමගින් යම් දෙනලද සමාජයක ආදායම බෙදීයාමේ විෂමතාවන් වල ප්‍රමාණය මනිනු ලබයි. සමාජයේ සෑම සාමාජිකයෙකුටම සමානව ආදායම බෙදී යන අවස්ථාවක මෙම සංගුණකය 0 ලෙස (0.0= අවම විෂමතාවය) දක්වන අතර සමාජයේ එක් සාමාජිකයෙක් සියලුම ආදායම ලබාගැනීමත් අනෙකුත් පිරිසට කිසිවක් නොලැබෙන්නේ නම් එවැනි අවස්ථාවක් 1 (1.0= උපරිම විෂමතාවය) ලෙසද දක්වයි. 1980/81 - 2002 අතර කාල පරිච්ඡේදය තුල ගෘහ ඒකක ආදායමේ ගිනි සංගුණකයෙහි අගය 0.43 සිට 0.48 දක්වා වැඩි වීමක් පෙන්නුම් කරන අතර මෙමගින් ශ්‍රී ලංකාවේ විෂමතාවය වැඩිවී ඇති බව පෙනීයයි. කෙසේවෙතත් 2006/07 -2009/10 කාලසීමාව තුල විෂමතාවය ගෘහ ඒකක වියදම් ජාතික මට්ටමින් මිනුම් කළවිට 0.41 සිට 0.39 දක්වා කැපී පෙනෙන ලෙස අඩුවීමක් දක්නට ලැබුණි.

ඉහළ දශමකය ලබන අදායමේ ප්‍රතිශතයක් ලෙස පහළ දශමකයන් දෙක ලබන ආදායමේ කොටස ගණනය කිරිම මගින් සාපේක්ෂ විෂමතාවය මැනීම සඳහා දශමකයන් අනුව ඒක පුද්ගල ආදායම උපයෝගී කරගනු ලැබේ. වියදම් (ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය) දශමකයන් උපයෝගී කරගෙන සාපේක්ෂ දරිද්‍රතාවය ගණනය කිරීම සඳහා මෙම ක්‍රමයම යොදා ගනු ලැබේ. 2009/10 කාලසීමාවේදී අවම දශමකයන් දෙක (දුප්පත්ම ගෘහ ඒකක 20% ) මුළු ආදායමෙන් හිමිකර ගනු ලැබූයේ 4.5 ක ප්‍රතිශතයක් පමණක් වන අතර ඉහළතම දශමකයන් දෙක මුළු ආදායමෙන් 39.5 ක ප්‍රතිශතයක් හිමිකර ගත්හ. එපමණක් නොව 2009/10 වර්ෂයන්හිදී පහලම

---

[2] දශමකයක් යනුවෙන් හැඳින්වෙන්නේ 100 ක්වූ මුලු ජනගහනයෙන් සියයට 10 කි

දශමකයන් හතර[3] (මුලු ආදායමෙන් 13.3 ක ප්‍රතිශතයක් හිමිකරගත්) ලබාගත්තේ ඉහළම දශමකයන් ලබාගත් ආදායමෙන් 34% ක් පමණි. මෙමගින්ද ශ්‍රී ලංකාවේ සාපේක්ෂ දරිද්‍රතාවය සැලකිය යුතු මට්ටමින් ඉහළ අගයක් ගන්නා බව අවධාරණයවේ.

මේ අනුව ශ්‍රී ලංකාවේ මුළු ආදායමෙන් අඩකට වැඩි ප්‍රමාණයක් (54.1% ක්) සමස්ථ ගෘහ ඒකක සංඛ්‍යාවෙන් ඉහළ ආදායම් ලබන්නා වූ ගෘහ ඒකක 20% කට ලැබෙන අතර අනෙක් ඉතිරි කුටුම්භ 80% ට ලැබෙන්නේ සමස්ථ ආදායමේ ඉතිරි අඩ පමණි (වගු අංක 1). එසේම ශ්‍රී ලංකාවේ පළමු ගෘහ ඒකක දශමකයන් 6 හෝ සමස්ථ ආදායමෙන් 60% ලබන්නා වූ පහල ආදායම් ලබන ගෘහ ඒකක ඔවුන්ට ලැබෙන සමස්ථ ආදායමෙන් 50% ක් සාමාන්‍යයෙන් ආහාර පාන සඳහා වැය කරති (DCS 2011).

**වගු අංක 1: ආදායම බෙදීයෑම දශමකයන් අනුව - 1980/81-2009/10**
**සමස්ථ ගෘහ ඒකක ආදායම ඒක පුද්ගල ආදායම් දශමකයන් අනුව (ප්‍රතිශතකය)**

| දශමක | 1980/81 | 1985/86 | 1990/91 | 1995/96 | 2002 | 2006/2007 | 2009/2010 |
|---|---|---|---|---|---|---|---|
| අවම | 3.5 | 2.4 | 1.9 | 2.1 | 1.7 | 1.6 | 1.6 |
| දෙවන | 5.3 | 3.8 | 3.3 | 3.5 | 3.1 | 2.9 | 2.9 |
| තෙවන | 5.9 | 4.5 | 4.3 | 4.4 | 4.1 | 3.9 | 3.9 |
| සතරවන | 6.7 | 5.3 | 5.3 | 5.3 | 5.0 | 4.8 | 4.9 |
| පස්වන | 8.0 | 6.2 | 6.4 | 6.4 | 6.0 | 5.8 | 6.0 |
| හයවන | 8.6 | 6.9 | 7.5 | 7.4 | 7.3 | 7.1 | 7.1 |
| හත්වන | 9.4 | 8.3 | 9.2 | 9.0 | 8.8 | 8.5 | 8.7 |
| අටවන | 10.9 | 10.0 | 10.8 | 11.4 | 11.2 | 10.8 | 10.8 |
| නවවන | 13.8 | 13.5 | 14.8 | 15.6 | 15.4 | 14.6 | 14.6 |
| ඉහළම | 27.4 | 38.8 | 36.5 | 34.8 | 37.4 | 40.1 | 39.5 |
| | | | | | | | |
| පහළම 40 ප්‍රතිශතය | 21.4 | 16 | 14.8 | 15.3 | 13.9 | 13.2 | 13.3 |
| | | | | | | | |
| ඉහළම 20 ප්‍රතිශතය | 41.2 | 52.3 | 31.3 | 50.4 | 52.8 | 54.7 | 54.1 |

මූලාශ්‍රයः ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, විවිධ වර්ෂ

ශ්‍රී ලංකාවේ ආදායම් බෙදීයාමේ ආකෘතිය ඇසුරෙන් සාපේක්ෂ දරිද්‍රතා තත්වයන්හි උපනතීන් සම්බන්ධයෙන් නිශ්චිත නිගමන වලට එළැඹීම පහසු කරුණක් නොවේ. කෙසේවෙතත් අවසාන අවුරුදු වල දත්ත පිළිබඳ අවධානය යොමු කිරිමේදී සාපේක්ෂ දරිද්‍රතාවය පිළිබඳ තත්වයන් පසුගිය දශක හතර තුලදී වඩාත් නරක අතට හැරී ඇති බව පැවැසිය හැකිය.

[3] පහලම දශමක සතර මුලු ගෘහ ඒකක වලින් වැඩි වශයෙන්ම දරිද්‍රතාවයෙන් පෙළන සියයට 40 ලෙසද නිර්වචනය කළ හැකිය

## 03. මූල්‍යමය නොවන ප්‍රවේශයන් සහ මිනුම්

ජනතාව සවිබල ගැන්වීම සහ අවදානමට මුහුණපෑම වැනි සමාජ, මානව සහ දේශපාලන මානයන්ද ඇතුළත්ව දරිද්‍රතාවය පිළිබඳ පුළුල් දෘෂ්ඨියකින් විමසා බලන්නා වූ ක්‍රමයන් උපයෝගී කරගැනීමේ අවශ්‍යතාවක් පවතින බව පැහැදිලිය. දරිද්‍රතාවය මිනුම් කිරීම සඳහා වන ශක්‍යතා ප්‍රවේශය හා සම්බන්ධ පැහැදිලි ලිපිලේඛන/අධ්‍යයන සමූහයක් ශ්‍රී ලංකාවේ නොමැත. එසේම මේ සඳහා යොදාගැනීමට සුදුසු මානයන්, දර්ශකයන් සහ සමූහනය කිරීමේ ක්‍රමවේද පිළිබඳ එකඟතාවක් දක්නටද නොලැබේ.

විශ්වීය මට්ටමින් පිළිගැනීමට ලක්වී ඇති මිනුම් ලෙසට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මානව සංවර්ධන දර්ශකය (HDI) මානව දරිද්‍රතා දර්ශකය (HPI) සහ සහශ්‍ර සංවර්ධන ඉලක්ක (MDGs) හැඳින්විය හැකිය. දරිද්‍රතාවය පිළිබඳ මෙම දර්ශක ශ්‍රී ලංකාවේ භාවිතා කරනු ලැබේ. මානව සංවර්ධන දර්ශකය සහ මානව දරිද්‍රතා දර්ශකය යන දෙකම නිරපේක්ෂ දරිද්‍රතාවය ඉලක්ක කරගනී. ශ්‍රී ලංකාව යොදාගනු ලබන්නේ සම්මත මානව සංවර්ධන දර්ශකයයි. එහිදී අවධානය යොමු කරන්නේ ලඟා කරගත් මට්ටම් වෙතය. කෙසේවෙතත් මානව දරිද්‍රතා දර්ශකය සමහර දර්ශක ඇතුළත් කරගනිමින් නවීකරණය කර ඇති අතර මෙමගින් අවාසිදායක තත්වය සහ හිගය පිළිබඳ අවධානය යොමු කරන බැවින් ශ්‍රී ලාංකීය සන්ධර්භයේ මානව දරිද්‍රතාවය හොඳින් හඳුනාගැනීමට සමත්වේ (UNDP 2013). ශ්‍රී ලංකාවේ මූල්‍යමය සහ මානව දරිද්‍රතා දර්ශකය සැකසීමේදී යොදාගන්නා ලද දර්ශකයන් දෙවන වගුවේ දැක්වේ.

**වගු අංක 2 : දරිද්‍රතාවය මැනීම සඳහා දර්ශක**

| මූල්‍යමය මිනුම් | මූල්‍යමය නොවන මිනුම් | |
|---|---|---|
| මූලික අවශ්‍යතා සඳහා යන වියදම් (CBN) | HDI දර්ශක* | HPI දර්ශක* |
| •ආදායම /පරිභෝජනය | • ජීවිත අපේක්ෂාව<br>• වැඩිහිටියන්ගේ සාක්ෂරතා අනුපාතිකය<br>• මූර්ත ඒක පුද්ගල දළදේශීය නිෂ්පාදිතය | • වයස අවුරුදු 40 ට පෙර මරණයට පත්වන ජනගහනයේ ප්‍රතිශතය<br>• වැඩිහිටියන්ගේ සාක්ෂරතා අනුපාතිකය<br>• පිරිසිදු පානීය ජල පහසුකම් ලබාගැනීමට ඇති නොහැකියාව<br>• වැසිකිළි නොමැති නිවාස සංඛ්‍යාව<br>• විධිමත් සෞඛ්‍ය පහසුකම් වලින් සමන්විත වෛද්‍ය ආයතන වලින් පරිබාහිරව සිදුවන උපත්වල අනුපාතිකය<br>• ප්‍රතිශක්තිකරණ එන්නත් ලබානොදුන් ළමුන් ගේ අනුපාතිකය<br>• ප්‍රතිශක්තිකරණ එන්නත් ලබානොදුන් ගැබිණි මව්වරුන්ගේ අනුපාතිකය<br>• විදුලිබලය සඳහා ප්‍රවේශය නොමැතිව සිටින ජනගහනයේ අනුපාතිකය |

*මූලාශ්‍රය : UNDP - ශ්‍රී ලංකාව 1998

ශ්‍රී ලංකාවේ සිදුකරන ලද සමීක්ෂණ වල දත්ත උපයෝගී කරගෙන ශ්‍රී ලංකාවේ බහුමානයන්ගෙන් යුත් සංකීර්ණ දරිද්‍රතාවය සම්බන්ධයෙන් බහුවිධ නිර්ණායකයන් ගණනය කිරීම සඳහා උත්සාහ දරන ලද අවස්ථාවන් දක්නට ලැබේ. සිද්ධිසේන සහ ජයතිලක (2004) මේ සඳහා පෝෂණය, ප්‍රාථමික අධ්‍යාපනය, සෞඛ්‍ය සත්කාර, සනීපාරක්ෂාව, බීමට සුදුසු ජලය, නිවාස තත්වය සහ ආදායම යන සාධක 7 මෙම බහුවිධ සංයුක්ත දර්ශකය සැකසීමට යොදාගන්නා ලදී. ආදායම පාදක කරගත්, දරිද්‍රතා රේඛාව පදනම් කරගත් ජනගහන දරිද්‍රතා දර්ශකය යොදාගෙන සිදුකරන ලද දිස්ත්‍රික් පරිමාණක ගත කිරීමේ අනුපිළිවෙළ බහුවිධ සංයුක්ත දර්ශකය යොදාගෙන මැනීමේදී වෙනස් වන බව මෙහිදී පෙනීගියේය.

බහුමාන දරිද්‍රතා දර්ශකය (MPI) ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මගින් ගණනය කරන ලදී (UNDP 2012). මෙහිදී සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ජීවන තත්වය යන මානයන් සහ දර්ශකයන් 10[4] ක් උපයෝගී කරගනු ලබන අතර එහිදී සියලුම දිස්ත්‍රික්කයන්හි බහුමාන දරිද්‍රතාවයට වඩා ආදායම් දරිද්‍රතාවය සැලකිය යුතු මට්ටමින් ඉහළ බව පෙනී ගියේය. මෙම තත්වය නාගරික සහ ග්‍රාමීය යන අංශ දෙකේම නිරීක්ෂණය කළ හැකිවිය. වතු අංශයේදී මෙම අගයන් දෙකෙහිම ප්‍රතිශතය 11.4 ලෙස සමාන අගයක් ගත්තේය.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය විසින් ද පර්යේෂණ කිහිපයක් උපයෝගී කරගෙන බහුමාන දරිද්‍රතාවය පිලිබඳ සංයුක්ත දර්ශක ගණනය කිරීමට ප්‍රයත්න දරා තිබේ. මායාදුන්නේ සහ රොමේෂන් (2011) කොළඹ නගරයේ තෝරාගත් භූමි ප්‍රදේශයක බහුමාන දරිද්‍රතාවය ඇස්තමේන්තු කිරීමේ හැකියාව සොයාබලා ඇත. මෙම අධ්‍යයනය බොහෝ දුරට ගවේෂණාත්මක එකක් විය. මෙහිදි අරමුණ වූයේ නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද දරිද්‍රතා රේඛාවට ඉහලින් පිහිටා ඇති කුඩා පරිමානයේ නිවාස නියැදියක (20) දත්ත උපයෝගී කරගෙන මාන 14 ක් ඇසුරෙන් ගණනය කරනු ලබන සංයුක්ත දර්ශකයක් මගින් බහුමාන නිර්ණායකයක් ගොඩනගා ගැනීමේ හැකියාව පරීක්ෂා කර බැලීමයි. ගණනය කරන ලද ඒකමාන සංයුක්ත දර්ශකය සහ තෝරාගන්නා ලද දේහලීය සීමාව අනුව, ප්‍රතිඵල වලින් පැහැදිලි වූයේ ගෘහ ඒකකයන්ගෙන් 30% ක් අවාසිදායක තත්වයේ මායිමට පහලින් පවතින බවත් ඒ අනුව මූල්‍යමය දරිද්‍රතා රේඛාව උපයෝගී කරගනිමින් නාගරික දරිද්‍රතාවය මැනීමේදී පවත්නා ප්‍රමාණයට වඩා අඩුවෙන් තක්සේරු වන බවයි.

බහුවිධ මානයන් මගින් ඇති වන්නා වූ අවාසිදායක තත්වයන් හි බලපෑම සමෘද්ධිලාභීන්ගේ ගෘහ ඒකකයන් හා සමෘද්ධි ප්‍රතිලාභිකයින් නොවන ගෘහ ඒකක සමග සැසැඳීමට සංජීවනී සහ අනෙකුත් පිරිස 2012 වසරේදී ප්‍රයත්න දරන ලදී. මෙහිදී උත්සාහ කරන ලද්දේ බදුල්ල දිස්ත්‍රික්කයේ 2010 වසරේ සිදුකරන ලද අධ්‍යයනයක් උපයෝගී කරගෙන සමෘද්ධි ඉලක්ක කණ්ඩායමේ දරිද්‍රතාවයේ

---

[4] ළමා මර්ත්‍යතාවය, පෝෂණය, පාසල් ගිය අවුරුදු ගණන, පාසල් යන ළමුන්, ආහාර පිසීම සඳහා භාවිතා කරන ඉන්ධන, වැසිකිළි, ජලය, විදුලිය, ගෙබිම සහ වත්කම්

ස්වභාවය ගැන වඩාත් හොඳ අවබෝධයක් ලබාගැනීමයි. මෙම අධ්‍යයනයේදී ආදායම, ගෘහ ඒකකයේ වත්කම් සහ වාසස්ථානය, රැකියාවේ ගුණාත්මක තත්වය, සවිබලගැන්වීම, අභිමානය, ශාරීරික ආරක්ෂාව සහ මානසික සහ පුද්ගල නිශ්‍රිත යහපැවැත්ම සම්බන්ධයෙන් වූ බහුවිධ මානයන් අවධානයට ගන්නා ලදී. මෙහිදී අනාවරණය වූ කරුණු වලින් පැහැදිලි වූයේ දරිද්‍රතාවයෙන් පෙලෙන කුටුම්භයන් ආදායම පිළිබඳ මානයෙන් පමණක් නොව තවත් මානයන් ගණනාවකින් අවාසිදාක තත්වයක සිටින බවය. මෙහිදී වැදගත් මානයන් ලෙසට ආදායම, මූලික අවශ්‍යතා, රැකියාවේ ගුණාත්මකබව, අභිමානය සහ ගරුත්වය හා මානසික සහ පුද්ගල නිශ්‍රිත යහපැවැත්ම හඳුනා ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේදී දරිද්‍රතාවය මැනීම සඳහා සමාජයෙන් කොන් කිරීමේ/බැහැර කිරීමේ ප්‍රවේශය උපයෝගී කරගැනීමේදී කණ්ඩායම් ප්‍රවේශයක් යොදාගනු ලබයි. උදාහරණ වශයෙන් මෙහිදී මෙම හෝ එම කණ්ඩායම සමාජයෙන් බැහැර කරන ලද සේ සලකනු ලබයි. සහභාගිත්ව ප්‍රවේශය, දරිද්‍රතාවය පිළිබඳ බහුමාන දර්ශක ගොඩනැගීම සඳහා වූ මානයන් හඳුනාගැනීමට සහ දරිද්‍රතාවයේ ගතික ක්‍රියාවලිය හඳුනාගැනීම සඳහා යොදාගනු ලබයි (ගුණවර්ධන 2005). දරිද්‍රතාවය මැනීමට උපයෝගී කරගනු ලබන මෙම ප්‍රවේශයේදී තර්ක කරනු ලබන්නේ දරිද්‍රතාවය සහ යහපැවැත්මෙන් තොර බව දරිද්‍රතාවයෙන් පෙලෙන්නකු විසින් නිර්වචනය කළ යුතුබවයි. ආසියානු සංවර්ධන බැංකුව විසින් 2001 වසරේදී සිදුකරන ලද “දිළින්දන්ගේ සංජානනය” යන අධ්‍යයනයේ දරිද්‍රතාවය යන්න යම් දෙයක් නොමැති බව එනම් රැකියාවක්, ප්‍රමාණවත් ආදායමක්, යටිතල පහසුකම්, නිවාස, ඉඩම්, ජලය සහ ආහාර නොමැතිබව ලෙස නිර්වචනය කර ඇත. දරිද්‍රතාවය පිළිබඳ නිර්වචනය පුද්ගලයා පදිංචිව සිටින ස්ථානය අනුවද වෙනස් වේ. හම්බන්තොට දී දරිද්‍රතාවය, දුර්වල ආර්ථික තත්වයන්, නිවසක්, රැකියාවක්, වගා කිරීම සහ පානය කිරීම සඳහා ජලය නොමැතිකම සහ සතුන් විසින් බවබෝග විනාශ කිරීම යන්නෙන් අදහස්වේ. අනෙක් අතට ත්‍රිකුණාමලයේදී දරිද්‍රතාවය යන්න ආහාර, ඇඳුම්, රැකියාවක් සහ නිදහස නොමැතිකම අදහස්වේ. ගැටුම් වලින් බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතාවය සම්බන්ධ බොහෝ තත්වයන් ආයුධ සන්නද්ධ ගැටුම සහ එහි ප්‍රතිවිපාකයන් හා සම්බන්ධය. එමනිසා ද්‍රව්‍යමය මානයන්ට අමතරව නිදහස නොමැතිවීම (ගමන් කිරිමේ සහ ජීවනෝපායන් සඳහා) යන්නද දරිද්‍රතාවයේ තත්වයක් ලෙස පෙන්වාදී ඇත.

## 04. ජනවිකාස ලක්ෂණ

2011 දී පවත්වන ලද ජන හා නිවාස සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20.3 ක් බව ඇස්තමේන්තු කර ඇත. 2001 සහ 2012 කාල පරිච්ඡේදය ඇතුළත ජනගහන වර්ධන අනුපාතිකය 0.7% වන අතර මෙමගින් ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය අඩු ශීඝ්‍රතාවයක් ගන්නා බව පෙනී යයි. සමස්ථ ජනගහනයෙන් 28.8% ක් බස්නාහිර පළාතේ ජීවත් වන අතර උතුරු පළාතේ සිටින්නේ සමස්ථ ජනගහනයෙක් 5.2% ක් පමණි. බස්නාහිර පළාතේ සමස්ථ ජනගහනයේ 39% ක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වල ජීවත් වෙති.

ශ්‍රී ලංකාවේ වැඩිම ජනගහන ඝනත්වය එනම් වර්ග කිලෝ මීටරයකට පුද්ගලයින් 3438 ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තාවේ. මෙය ජාතික වශයෙන් දක්නට ලැබෙන රේඛාවට එනම් වර්ග කිලෝ මිටරයකට පුද්ගලයින් 323 මෙන් දස ගුණයකටත් වඩා වැඩිය. අඩුම ජනගහන ඝනත්වයක් වාර්තා වන්නේ මුලතිව් දිස්ත්‍රික්කයෙනි. එය වර්ග කිලෝ මීටරයකට පුද්ගලයින් 38 කි. ශ්‍රී ලංකාවේ දළ මරණ අනුපාතිකය පුද්ගලයින් 1000 කට 17.6 ක් සහ සාඵල්‍යතා අනුපාතිකය කාන්තාවකට 2.3 ක් ලෙස දැක්වේ (DHS 2009). 2001 වසරේදී පවත්වන ලද ජන හා නිවාස සංගණනයට අනුව ජනගහනයෙන් 82% ක් සිංහල ද 4% ක් ශ්‍රී ලාංකික දෙමළද (උතුරු සහ නැගෙනහිර පළාත්වල සමස්ථ ජනගහනය ඇතුළත්වී නොමැති බැවින් මෙය අඩු අගයක් වේ), 5% ක් ඉන්දියානු දෙමළ සහ 8% ක් ශ්‍රී ලාංකික මුස්ලිම් ජාතිකයින්ද වේ.


ශ්‍රී ලංකාවේ ජනගහනය ඉතා සීඝ්‍රයෙන් වයස්ගත ජනගහනයක් බවට පත්වෙමින් තිබෙන අතර 2040 වසර වන විට ශ්‍රී ලාංකීය ජනගහනයෙන් 25% ක් වයස අවුරුදු 60ට වැඩිවනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. (ලෝක බැංකුව 2008). 2021 වසර වන විට ජනගහනයේ වයස අවුරුදු 60ට වැඩි කොටස 12.5% සිට 16.7% දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. වයස්ගත ජනගහනය වැඩිවීම ශ්‍රී ලංකාවේ අනුගමනය කරන්නා වූ සාඵල්‍යතා අනුපාතිකය අඩු කිරීමේ පවුල් සැලසුම් ප්‍රතිපත්තියේ හා ආයු අපේක්ෂාව වැඩිවීමේ ප්‍රතිඵලයන් වේ. ශ්‍රී ලංකාව වර්තමානයේ ප්‍රජාවිකාසනාත්මක වශයෙන් අමතර ප්‍රතිලාභයක් භුක්ති විඳිමින් සිටී. එනම් ළමා සහ වයස්ගත ජනගහනයත් සමග සැසැඳීමේදී ජනගහනයෙන් විශාල ප්‍රතිශතයක් (67%) ක් වැඩ කරන වයසේ (15-64) පසුවීමයි. ඒ අනුව උදාවී ඇති මෙම අවස්ථාව වර්ධන සහ යහපැවැත්ම ඉහළ නැංවීමට යොදාගත යුතුවේ.

## 5. දරිද්‍රතා මට්ටම්

### 5.1 ජාතික මට්ටමේ දරිද්‍රතාවය

ශ්‍රී ලංකාව පහළ මධ්‍යම මට්ටමේ ආදායම් ලබන රටක් ලෙස පවතින නමුත් මානව සහ සමාජ දර්ශකයන්හි තත්වයන් සංවර්ධිත රටවල තත්වයන්ට සමාන මට්ටමින් පැවතීම නිසා ශ්‍රී ලංකාව, සංවර්ධනය පිළිබඳ පර්යේෂකයින්ගේ අවධානයට නිරන්තරයෙන් ලක්වේ. දරිද්‍රතාවය පිළිබඳව නිරපේක්ෂ හෝ සාපේක්ෂ යන කුමන ආකාරයෙන් මැනීම් කළද මෙම සාර්ථකත්වයන් පරිභෝජන දරිද්‍රතාවය සම්බන්ධයෙන් දක්නට නොලැබේ.

1 රූප සටහන : ජාතික දරිද්‍රතා උපනතීන්





මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, විවිධ වර්ෂ

කෙසේවෙතත් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාමට්ටම් වල පහලයාමේ උපනතියක් 1995/96-2009/10 කාලසීමාවන්හිදී දක්නට ලැබේ. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිලවශයෙන් නිකුත් කරන ලද දරිද්‍රතා රේඛාවට අනුව 1995/96 දී දරිද්‍රතාවය 28.8% ක් වූ අතර එය 2002 දී 22.7% කට අඩුවී තිබේ. මෙය 2006/07 කාලසීමාවේදී 15.2% දක්වාද 2009/10 කාල සීමාවේදී 8.9% දක්වාද තවදුරටත් පහළ බැස ඇත (රූපය 1).

## 5.2 දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ දරිද්‍රතාවය

2009/10 කාලසීමාවේදී ජනගහන දරිද්‍රතා දර්ශකයේ වැඩිම අගයක් වාර්තාවී ඇත්තේ (14.8%) නැගෙනහිර පළාතෙන් වන අතර මීලග ස්ථානය (13.7%) හිමිවී ඇත්තේ ඌව පළාතටය. 1990/91 සිට 2009/10 කාලසීමාව අතර නැගෙනහිර පළාතේ හැරුණු විට අනෙකුත් සියලුම පළාත්වල දරිද්‍රතා දර්ශකය පහල ගොස් ඇති බව පෙනීයයි. 2006/07-2009/10 කාලසීමාව තුළදී සබරගමුව, උතුරුමැද සහ මධ්‍යම පළාතේ දරිද්‍රතාවය 50% කට වඩා වැඩි ප්‍රමාණයකින් පහළ ගොස් ඇත. බස්නාහිර පළාතේ කුටුම්භයන්ගෙන් දරිද්‍රතාවයෙන් පෙලෙන්නේ 3% ක් වශයෙන් දක්වෙන නමුත් එය සත්‍ය අගයන්ගෙන් දක්වීමේදී විශාල සංඛ්‍යාවක් දරිද්‍රතාවයෙන් පෙලෙන්නන් බවට පත්වන්නේ ජනගහනයෙන් තුනෙන් එකක් බස්නාහිර පළාතේ ජීවත් වන බැවිනි.

2 රූප සටහන : දිස්ත්‍රික්කයන් අනුව ජනගහන දරිද්‍රතා දර්ශකය




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, විවිධ වර්ෂයන්

දිස්ත්‍රික්කයන් සැසැඳීමේදී 2009/10 කාල පරිච්ඡේදයේදී ජනගහන දරිද්‍රතා දර්ශකයේ වැඩිම අගයක් (20.3%) (නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද දරිද්‍රතා රේඛාවට පහතින් සිටින ජනගහනයේ ප්‍රතිශතය) වාර්තා වන්නේ මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වන අතර අඩුම සංඛ්‍යාව 2.3% වාර්තාවූයේ වවුනියා දිස්ත්‍රික්කයෙනි. දෙවන රූප සටහනට අනුව 2009/10 කාල පරිච්ඡේදය තුලදී දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතා මට්ටම් කොළඹ දිස්ත්‍රික්කයේ 3.6% සිට මොනරාගල දිස්ත්‍රික්කයේ 14.5% දක්වා පරාසයක පිහිටයි. සියලුම දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතා මට්ටමෙහි කැපීපෙනෙන අඩුවීමක් 2006/07 සිට දක්නට ලැබේ.


2006/07 කාල සීමාවේ සිට දරිද්‍රතාවයේ වැඩිම පහල බැසීමක් (77.6%) වාර්තාවූයේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ 2006/2007 සිට 46% දරිද්‍රතාවය අඩුවීමක් වාර්තා වූ අතර 2002-2006/2007 කාලවකවානුවේදී 60% ක ප්‍රතිශතයකින් දරිද්‍රතාවය අඩුවීමක් වාර්තා විය. වඩාත්ම දරිද්‍රතාවයෙන් පෙලෙන බදුල්ල, මොනරාගල සහ රත්නපුර දිස්ත්‍රික්කයන්ගෙන්ද දරිද්‍රතාවය 50% ක ප්‍රතිශතකයකින් අඩුවීමක් 2006/2007 දී පෙන්නුම් කලේය. උතුරු සහ නැගෙනහිර දිස්ත්‍රික්ක හැරුණු විට අනෙකුත් දිස්ත්‍රික්ක අතරින් වඩාත්ම දිළිඳු දිස්ත්‍රික්කය මොනරාගල දිස්ත්‍රික්කයයි. 2002 වසරේ සිට නුවරඑළිය දිස්ත්‍රික්කය හැරුණු විට

අනෙකුත් සියලුම දිස්ත්‍රික්කයන් හි දරිද්‍රතාවය අඩුවීමේ උපනතියක් පෙන්නුම් කලේය.

**5.3 ආංශික දරිද්‍රතාවය**

2006/07-2009/10 කාලසීමාව තුල අංශ 3හිම දරිද්‍රතා මට්ටම් අඩුවීමක් පෙන්නුම් කලේය (රූපය 3). 2002-2006/07 කාලයේදී වැඩිම දරිද්‍රතාවක් වාර්තාවූයේ වතු අංශයෙන් වුවත් 2006/07-2009/10 වැඩිම අඩුවීම වතු අංශයෙන් වාර්තා විය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය තවදුරටත් ග්‍රාමීය ප්‍රපංචයක් ලෙස පවතී. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩි කොටසක් (80%) නියෝජනය වන්නේ ග්‍රාමීය අංශයෙනි. එම නිසා 2002 වසරේ සිට ග්‍රාමීය අංශයේ දරිද්‍රතාවය කැපීපෙනෙන ලෙස අඩුවීම ජාතික මට්ටමේ දරිද්‍රතාවය අඩුවීමට ප්‍රධාන වශයෙන් දායක විය.

**3 රූප සටහන : ජනගහන දරිද්‍රතා දර්ශකය - අංශ අනුව**




මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, විවිධ වර්ෂයන්

2013 වසරේදී නානායක්කාර විසින් ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණ (HIES) (2009/2010) දත්ත භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයෙන් පෙලෙන කණ්ඩායම් හඳුනාගැනීමට ප්‍රයත්නයක් දරන ලදී. ආදායම් දරිද්‍රතාවයෙන් පෙලෙන ජනතාවගෙන් හතරෙන් එකක් (23.6%) "කෘෂිකාර්මික නොවන කම්කරු සහ මීට සමාන ශ්‍රමිකයින්" ගෘහ මූලිකත්වය දරන කුටුම්භයන්ගෙන් වාර්තාවන බව මෙහිදී පෙනී ගියේය. මීලඟ අගය වන (19.4%) "පුහුණු කෘෂිකාර්මික, වන සම්පත් ආශ්‍රිත

කර්මාන්ත සහ ධීවර ශ්‍රමිකයින්ගෙන්" වාර්තාවිය. මීට සමාන රටාවක් පෙන්නුම් කරමින් "බහුමාන දරිද්‍රතාවයේ" ඉහළම නියෝජනය මෙම සමාජ ආර්ථික කණ්ඩායම් වලට අයත් ජනගහනයෙන් වාර්තා විය.

## 06. සමාජ ආර්ථික තත්වයන්

### 6.1 අධ්‍යාපනය

ශ්‍රී ලංකාව සමාජ ආර්ථික සංවර්ධනයේ ඉහළ මට්ටම් කරා ලඟාවීමට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ ශ්‍රී ලංකාව විසින් දිගුකාලීනව අනුගමනය කරන ලද සමාජ සුභසාධන ප්‍රවේශයන් බව පැවසිය හැකිය. 90.3%ක් ප්‍රාථමික අධ්‍යාපනයට යොමුවීමට නිදහස් අධ්‍යාපනය මගපාදා ඇත. වැඩිහිටි සාක්ෂරතා අනුපාතිකය 92.2% වශයෙන් වැඩි වෙමින් පවතින අතර මෙය පිරිමින්ගෙන් 93.5% ක්ද ස්ත්‍රීන් ගෙන් 91.1% ක්ද වශයෙන් වාර්තාවේ (DCS 2011). කෙසේ වෙතත් අංශ හා දිස්ත්‍රික්ක අනුව වෙනස්කම් නිරීක්ෂණය කළ හැකිය.


නාගරික හා ග්‍රාමීය අංශයන් හා සසඳා බැලීමේදී වතු අංශයේ ප්‍රාථමික අධ්‍යාපනයට යොමුවීමේ (94.6%) පසුගාමී බවක් පෙනීයයි. ප්‍රාථමික අධ්‍යාපනයට යොමුවීමේ වැඩිම අනුපාතිකයන් වාර්තා වූයේ හම්බන්තොට (100%) සහ ගාල්ල (99.3%) දිස්ත්‍රික්ක වලින් වන අතර අවම අගය මාතරින් වාර්තා විය. වයස අවුරුදු 15-24 අතර සාක්ෂරතා අනුපාතිකය සියලුම අංශයන් හා දිස්ත්‍රික්කයන් සම්බන්ධයෙන් 2003-2006/07 කාල පරිච්ඡේදයේදී වැඩිවී තිබේ. වසය අවුරුදු 15 සිට 24 දක්වා පුද්ගලයින්ගේ අවම සාක්ෂරතා අනුපාතිකයන් වාර්තා වන්නේ රත්නපුර (91.6%) සහ පුත්තලම (92.7%) දිස්ත්‍රික්ක වලිනි.

**වගු අංක 3 -**
**ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය සහ ප්‍රාථමික අධ්‍යාපනයට යොමුවීම අංශ අනුව 2006/07**

| ක්ෂේත්‍රය/දිස්ත්‍රික්කය | ප්‍රාථමික අධ්‍යාපනයට යොමුවීම | සාක්ෂරතා අනුපාතිකය වයස අවුරුදු 15-24 |
|---|---|---|
| නාගරික | 97.4 | 95.7 |
| ග්‍රාමීය | 97.6 | 96.6 |
| වතු | 94.6 | 83.9 |

මූලාශ්‍රය: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2010

**4 රූප සටහන :**
**ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය සහ ප්‍රාථමික අධ්‍යාපනයට යොමුවීම දිස්ත්‍රික්ක අනුව 2006/07**




මූලාශ්‍රය: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2010

**6.2 සෞඛ්‍යය**

සෞඛ්‍ය සත්කාර සඳහා රජය විසින් පසුගිය කාලසීමාවේදී විශාල පිරිවැයක් දැරීම සහ මුදල් වෙන් කිරීම, ජීවන අපේක්ෂාව අවුරුදු 74.9 දක්වා ඉහළ යාමටත්, 1966 දී මුළු උපත් 1000 කට 113 ක් වශයෙන් වාර්තාවූ ළමා මරණ අනුපාතිකය 2010 වසරේදී 17 දක්වා අඩුකිරීමටත් හැකිවීමේ කැපී පෙනෙන වර්ධනයක් ඇතිවීමට හේතු වී ඇත. ළමා ප්‍රතිශක්තිකරණ අනුපාතිකයද 97% දක්වා ඉහල ගොස් ඇත. එසේම මාතෘ මරණ අනුපාතිකයේ ද අඩුවීමක් දක්නට ලැබෙන අතර පුහුණුව ලද පුද්ගලයින් ගේ සහය ඇතිව සිදුවන ළදරු උපත් සංඛ්‍යාව 1980 දී 75% සිට සිට 2006 දී 98-6% දක්වා ඉහල ගොස් ඇත (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2010).

ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සෑහීමකට පත්විය හැකි මට්ටමක පැවැතියත් වැළැක්විය හැකි රෝග සම්බන්ධයෙන් එතරම් සතුටුවිය හැකි නොවන අතර මෙය දරිද්‍රතාවය ඇතිවීමට හේතුකාරක වේ. මෙයට අමතරව මෙම සෞඛ්‍ය සේවා සැපයීම දිස්ත්‍රික්කයන් අනුව සහ සමහරවිට දිස්ත්‍රික්කයන් තුල ගම්මාන අනුවද වෙනස් වේ. සෞඛ්‍ය සත්කාර පිළිබඳ ජාතික ඇස්තමේන්තු වලදී රටේ අනෙකුත් ප්‍රදේශයන්ට වඩා අඩු මට්ටමක් අපේක්ෂා කළ හැකි උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක ඇතුළත්වී නොමැති බව සැලකිය යුතුවේ.

### 6.3 ජීවන තත්වයන්

ජීවන තත්වයන් සම්බන්ධයෙන් කැපීපෙනෙන වර්ධනයක් ශ්‍රී ලංකාවේ වාර්තාවේ. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2011 සංඛ්‍යාලේඛන අනුව කුටුම්භයන්ගෙන් 87.7% කට ආරක්ෂාකාරී පානීය ජල පහසුකම් තිබේ. 83% කට වැඩි දියුණු කළ සනීපාරක්ෂක පහසුකම් ඇති අතර 85.3% කට විදුලි බලය තිබේ. කෙසේ වෙතත් ආරක්ෂාකාරී පානීය ජල පහසුකම් සම්බන්ධයෙන් ඌව සහ සබරගමුව පළාත් වල අනු පිළිවෙලින් 30.1% සිට 29.6% කට ආරක්ෂාකාරී පානීය ජල පහසුකම් නොමැති බව වාර්තාවේ. යාපනය සහ මඩකලපුව දිස්ත්‍රික්කයන් වල වැසිකිළි පහසුකම් නොමැති නිවාස වල වැඩි ප්‍රතිශතයක් දක්නට ලැබේ.

දැනුම ලබාගැනීම සහ තොරතුරු සොයාබැලීමට නව තාක්ෂණික ක්‍රම යොදාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කැපීපෙනෙන වර්ධනයක් පෙන්වයි. මෙය ගුවන් විදුලිය සහ රූපවාහිනිය වැඩි වශයෙන් භාවිතා කිරීමෙන් පැහැදිලිවේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව මගින් සිදුකරන ලද පරිගණක භාවිතය සම්බන්ධ සමීක්ෂණයේදී පරිගණකය නාගරික අංශයේ ගෘහ උපකරණයක් බවට පත්වෙමින් තිබෙන බව පෙනී ගියේය.

පෞද්ගලික පරිගණක තිබෙන ගෘහ ඒකක සංඛ්‍යාව 2004 වසරේ 3.8% සිට 2006/7 වසරේදී 8.2% දක්වා ඉහළ ගොස් ඇත. පරිගණක භාවිතය සම්බන්ධයෙන් නාගරික අංශයේ සහ වෙනත් අංශයන් හි සහ පළාත් අනුව කැපී පෙනෙන වෙනස්කම් දක්නට ලැබේ. නාගරික අංශයේ ගෘහ ඒකක වලින් 17.8% ක පරිගණක තිබෙන අතර මෙම ප්‍රතිශතයන් පිළිවෙලින් ග්‍රාමීය සහ වතු අංශයේ 6.9% ක් හා 1.1% වේ. ශ්‍රී ලංකාවේ කුටුම්භයන්ගෙන් 8.2% කට පරිගණක පහසුකම් තිබුණත් (2006/07 වසරේදී) අන්තර්ජාල පහසුකම් පවතින්නේ 2.4% කට සහ විද්‍යුත් තැපැල් පහසුකම් භාවිතා කරන්නේ 2.3% පමණක් බවත් හෙළිවී තිබේ.

### 6.4 ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ ප්‍රගතියේ මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් ඇත. පළාත් අනුව වෙනස්කම් දක්නට ලැබුණත් කාන්තාවන්ගේ සාක්ෂරතාවය ඉහල අගයක් ගන්නා අතර කාන්තාවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනයට යොමුවීම පිරිමින්ට වඩා ඉහළ අගයක් ගනී. අනියම් කම්කරු ක්ෂේත්‍රයද ඇතුලුව කාන්තාවන් විශාල පිරිසක් ආර්ථිකයේ අවිධිමත් අංශයේ රැකියාවල නිරතවීම තුලින් කාන්තාවන්ගේ විරැකියා අනුපාතිකය පහළ යමින් පැවැතියද පිරිමින් හා සැසඳීමේදී සමස්ථ ශ්‍රම වෙළඳපොලේ කාන්තාවන්ගේ සහභාගිත්වය අඩු බවක් පෙනීයයි. එසේම කෘෂිකාර්මික කම්කරුවන්, අඩුවෙන් වැටුප් ගෙවීම් කරන ශ්‍රමිකයින් සහ ගෙවීමක් නොලබන පවුලේ ශ්‍රමිකයන්, අඩු මට්ටමේ ආදායම් ලබන කාන්තාවන් විසින් ගෘහමූලිකත්වය දරන පවුල්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවිඳින සහ යුද්ධයෙන් වැන්දඹුවන් බවට පත්වූවන් සහ ආයුධ

---


[5] ප්‍රජා ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව සාරාංශ ලිපිය (ප්‍රකාශයට පත් නොකරන ලද වාර්තාව) සඳහා 2002 වසරේදී සිදුකරන ලද දත්ත එක්රැස් කිරීමට දිස්ත්‍රික්ක 17ක පවත්වන ලද සම්මුඛ සාකච්ඡා

සන්නද්ධ ගැටුම් වලින් පීඩාවට පත්වූවන් ඇතුලුව අවදානමට පත්විය හැකි කණ්ඩායම් වලින් බහුතරයක් කාන්තාවන්ගෙන් සමන්විතවේ (ෂොක්මන් 2012).

1995 දී මානව සංවර්ධන වාර්තාව මගින් කාන්තාවන්ගේ තත්වය පිළිබඳව අවධාරණය කරන්නා වූ මානව සංවර්ධන මිනුම් දෙකක් හඳුන්වා දෙන ලදී. මෙයින් පළමුවැන්න ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ සංවර්ධන දර්ශකය (GDI) පිරිමින් සහ කාන්තාවන් අතර කාර්යය සාධනය සම්බන්ධයෙන් දක්නට ලැබෙන විෂමතාවයන් සැලකිල්ලට ගනු ලබයි. දෙවැනි මිනුමවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සවිබලගැන්වීම (GEM) මගින් නියෝජනය පිළිබඳ මැනීමක් සිදුවන අතර මෙහිදී දේශපාලන සහ ආර්ථික ක්ෂේත්‍රයන්හි කාන්තාවන්ගේ නියෝජනය පිළිබඳව සැලකිල්ලට ගනු ලබයි. ඉහත දර්ශකයන්හි පවත්නා විවිධ වූ සංකල්පීය සහ ක්‍රමවේදාත්මක සීමාවන් නිසා 2010 වසරේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතා දර්ශකය (GII) හඳුන්වා දෙන ලදී. මෙමගින් ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ විෂමතා මානයන් තුනක් ඔස්සේ එනම් පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන්ගේ ප්‍රජනන සෞඛ්‍ය තත්වය, ඔවුන්ගේ සවිබලගැන්වීම සහ ශ්‍රම වෙළඳපොලේ සහභාගිත්වය මිනුම් කරනු ලැබේ (UNDP 2012).

2011 වසර සඳහා වූ GII දර්ශකයේ 0.419 ක අගයක් සනිටුහන් කරමින් රටවල් 146 ක් අතුරින් 74 වැනි ස්ථානය ශ්‍රී ලංකාව හිමිකරගෙන ඇත. ශ්‍රී ලංකාව ඉන්දියාවට සහ පාකිස්ථානයට ඉහළින් සහ දකුණු ආසියාවේ සාමාන්‍යය අගයට වන 0.601 ට වඩා ඉහළින් සිටී. UNDP (2012) අනුව අවම GII අගය වන 0.474 හම්බන්තොටින්ද, ඊලඟ අගයන් අනුරාධපුරයෙන් සහ ගම්පහෙන් ද වාර්තාවේ. ඉහළම GII අගය මඩකලපුවෙන් 0.807 සහ ඊලඟ වැඩිම අගය පුත්තලමෙන් වාර්තාවේ. (වගුව 4). මඩකලපුවෙන් ඉහළ GII අගයක් වාර්තාවන්නේ එම දිස්ත්‍රික්කයෙන් කිසිම කාන්තාවක් පාර්ලිමේන්තුව නියෝජනය නොකිරීම සහ ශ්‍රම බලකායේ සහභාගිත්වය 24.4% තෙක් අඩුවීම නිසාය. වෙනත් දිස්ත්‍රික්කයන් හා සසඳන විට මඩකලපුව දිස්ත්‍රික්කයේ මාතෘ මරණ අනුපාතික සහ යොවුන් සාඵල්‍යතා අනුපාතික ද ඉහළ අගයක් ගනී.

5 රූප සටහන ඃ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතා දර්ශකය දිස්ත්‍රික්ක අනුව 2011




මූලාශ්‍රයඃ UNDP ශ්‍රී ලංකාව 2012

## 7. ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය

ශ්‍රී ලංකාව පහළ මධ්‍යම ආදායමක් ලබන රටකි. එහි ඒක පුද්ගල ආදායම 2012 වසරේදී ඇමෙරිකානු ඩොලර් 2923 කි. දළ දේශීය නිෂ්පාදනයේ (GDP) වර්ධනය 2012 දී 6.4% ක්වූ අතර 2011 දක්නට ලැබුණු වර්ධන අනුපාතිකය වන 8.2%සමග සැසැඳීමේදී මෙහි අඩුවීමක් දක්නට ලැබේ. වසර 30 පුරා පැවැති සිවිල් යුද්ධය 2009 වසරේදී අවසන්වීමත් ඉන් අනතුරුව සාමකාමී වාතාවරණයක් පැවතීම ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වීමට, යටිතල පහසුකම් වර්ධනය වීමට සහ උතුරු නැගෙනහිර ආර්ථික ක්‍රියාකාරිත්වයන් නැවත පනගැන්වීමට හේතුවිනි. ඒ අතරම සාර්ව මට්ටමේ ආර්ථික තත්වයන්හි පැවැති යහපත් වාතාවරණයද මෙයට දායකවිනි. මෙම ශක්තිමත් වර්ධන ක්‍රියාකාරිත්වය විරැකියා තත්වයන් 4.0% දක්වා අඩු කිරීමට හේතු විය. (ශ්‍රී ලංකා මහ බැංකුව 2012)

## 8. සාරාංශය

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය 1990 වසරේ 30.4% සිට 2010 වසරේදී 8.9% දක්වා අඩුවී ඇත. කෙසේ වෙතත් මිලියන 1.8 ක ජනතාවක් තවමත් දරිද්‍රතා රේඛාවට පහලින් ජීවත්වන අතර තවත් විශාල ප්‍රමාණයක් දරිද්‍රතා රේඛාවට වඩා යාන්තමින් ඉහළින් ජීවත්වේ. මෙම පුද්ගලයින් ආර්ථික සහ වෙනත් කරුණු වල බලපෑම නිසා නැවත දරිද්‍රතාවයට පත්වීමේ අවදානම තිබේ. (නානායක්කාර 2013). පළාත් අනුව දරිද්‍රතාවයේ වෙනස් කම් දක්නට ලැබෙන අතර නැගෙනහිර පළාතේ දරිද්‍රතාවය ඉහළ මට්ටමක පවතී. අංශ වශයෙන් ගත්විට වැඩිම දරිද්‍රතාවයක් වාර්තාවන්නේ වතු අංශයෙන් වුවත් ග්‍රාමීය ජනතාව දරිද්‍රතාවයට පත්වීමේ වැඩි නැඹුරුවක් පවති. ආදායම අනුව සහ බහුමාන මිනුම් වලට අනුව දරිද්‍රතාවයට පත්වී සිටින කාණ්ඩයන් වැඩි වශයෙන් වාර්තාවන්නේ කෘෂිකාර්මික නොවන කම්කරුවන් හා ඊට සමාන කාර්යන්හි නිරතවී සිටින ජනතාව අතරිනි.

උතුරු සහ නැගෙනහිර පළාත්වල යුධ තත්වයක් පැවැතියද නිදහස ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාවේ දළදේශීය නිෂ්පාදිතයේ සාමාන්‍ය වර්ධන අනුපාතිකය 5% ක් පමණ විය. 2009 වසරේ දී යුද්ධය නිමාවීම ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා යහපත් වාතාවරණයක් උදාකරලීමට මහත් සේ දායක වූ අතර රජයේ සහ වෙනත් අංශයන් විසින් සිදුකරන ලද ආයෝජන හේතු කොටගෙන 2010 සහ 2011 වසර වලදී සියයට අටක වාර්ෂික වර්ධන අනුපාතිකයක් ලබාගැනීමට හැකිවිය. ආර්ථිකය අඛණ්ඩව වර්ධනය වීම ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අඩුකිරීමේ දී කැපීපෙනෙන ප්‍රගතියක් අත්කරගැනීමට හේතු විණි.

අනෙක් රටවල් හා සැසඳිමේදී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, සෞඛ්‍යය, සහ ජීවන තත්වයන් සම්බන්ධයෙන් ලඟාකරගෙන ඇති උසස් තත්වයන් ද දරිද්‍රතා මට්ටම් අඩු කිරීමට දායකවී ඇත. පසුගිය වසර වලදී රැකියා කරන කාන්තාවන්ගේ ප්‍රමාණය වර්ධනය වී තිබුණත් කාන්තාවන් විසින් උපයන ආදායමේ මධ්‍යන්‍යය පිරිමින් උපයන ආදායමට වඩා අඩු මට්ටමක පවතින බැවින් කාන්තාවන් විසින් ගෘහමූලිකත්වය දරන කුටුම්භයන්හි යහපැවැත්මට එමගින් බලපෑමක් ඇතිවී තිබේ. කෙසේවෙතත් අනෙකුත් රටවල් සමග සැසැඳිමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ප්‍රගතියේදී ශ්‍රී ලංකාව යහපත් මට්ටමක සිටී.

විවිධ මානයන් උපයෝගී කරගෙන දරිද්‍රතාවය මැනීම සඳහා වූ ප්‍රයත්නයන් ඉහළ යමින් තිබේ. ආදායමට අමතරව සෞඛ්‍ය, අධ්‍යාපනය, ජලය, විදුලිබලය, නිවාස තත්වය, රැකියාව, සවිබලගැන්වීම, අභිමානය, මානසික සහ පුද්ගලික යහපැවැත්ම ආදී වෙනත් සාධක ගණනාවක් මේ සඳහා යොදාගෙන තිබේ. මෙම අධ්‍යයන මගින් දරිද්‍රතාවය පිළිබඳව සිදු කරන ලද අධ්‍යයන මිශ්‍ර ප්‍රතිඵල ගෙන දෙන අතර ඒවායේ ප්‍රතිඵල, අධ්‍යයන සඳහා යොදාගනු ලබන්නා වූ දර්ශකයන් සහ ක්‍රමවේද මත රඳාපවතින බව පෙනීයයි.

## විමර්ශන/වැඩිදුර කියවීම්


Asian Development Bank, 2001. Perceptions of the Poor: Poverty consultations in four districts of Sri Lanka, Manila.

Alailima, P., 2007. The conventional Approaches: An overview of poverty in Sri Lanka, in Fresh Perspectives: Exploring alternative dimensions of poverty in Sri Lanka, eds. Cader, Azra Abdul and Remnant, F., Centre for Poverty Analysis, Colombo.

Central Bank of Sri Lanka, 2012. Annual Report 2011, CBSL, Colombo.

Chronic Poverty Research Centre, 2001. Chronic Poverty: meanings and analytical framework, United Kingdom.

Department of Census and Statistics, (various years). Household Income and Expenditure Survey various years: Final Report, DCS, Colombo.

Department of Census and Statistics, 2011. Labour Force Survey Annual Report 2011, DCS, Colombo.

Department of Census and Statistics, 2009. Sri Lanka Demographic and Health Survey 2006/07, DCS, Colombo.

Gunewardena, D., 2000. Consumption Poverty in Sri Lanka. 1985-1996, External Resources Department, Ministry of Finance and Planning, Colombo.

Gunewardena, D., 2004. Poverty measurements: Meanings, methods and requirements, Centre for Poverty Analysis, Colombo.

Gunewardena, D., 2005. Improving Poverty Measurements in Sri Lanka, Working Paper Series No. 9, Centre for Poverty Analysis, Colombo.

Institute of Policy Studies, 2010. Millennium Development Goals Sri Lanka: Country Report 2008/2009, Institute of Policy Studies, Colombo.

Mayadunne G. and Romeshun, K., 2011. Appropriateness of the Sri Lanka Poverty Line to Measure Urban Poverty: Case of Colombo, International Institute for Environment and Development, UK.

Nanayakkara, A.G.W., 2013. Poverty in Sri Lanka: Who are Poor and Where are They, in Economic Review, ed. Fredrick Abeyratne, Vol. 38 (11 & 12), pp 54-58, People's Bank, Colombo.

United Nations Development Programme (various years). National Human Development Report, Colombo.

Sen, A., 1999, Development as Freedom, Oxford University Press, UK.

Siddhisena, P. and Jayathilaka, R., 2004, Identification of the Poor in Sri Lanka: Development of Composite Indicator and Regional Poverty Lines, Institute of Policy Studies, Colombo.

Sanjeewanie, K.I.H., De Silva, N. and Shivakumaran, S., 2012. Multi-dimensional poverty among Samurdhi welfare recipients in Badulla district, Sri Lanka, PMMA Working Paper 2012-03, Partnership for Economic Policy, Canada.

Shockman, Y., (2012) Feminization of Poverty in Sri Lanka, Marga Institute Centre for Development Studies, online article available at

http://www.google.lk/url?sa=t&rct=j&q=&esrc=s&source=web&cd=1&ved=0CCoQFjAA&url=http%3A%2F%2Fwww.margasrilanka.org%2FFeminization%2520of%2520Poverty%2520in%2520Sri%2520Lanka.doc&ei=hkPdUdeWJsmtrAeJ04HwAw&usg=AFQjCNFZWwyunEjM_OhV33iMALAt8HaUtg&bvm=bv.48705608,d.bmk

World Bank, 2008. Sri Lanka Addressing the Needs of an Aging Population, Human

Development Unit, South Asia Region, World Bank.

**සංක්ෂිප්ත ප්‍රකාශන මාලාව**

**දරිද්‍රතා සංක්ෂිප්ත**

No. 1 Overview of Poverty in Sri Lanka
No. 2 Livelihoods and Poverty in Sri Lanka
No. 3 Poverty Reduction Strategy in Sri Lanka
No. 4 Dimensions of Conflict Outside the North and East of Sri Lanka
No. 5 Poverty and Youth Issues in Sri Lanka
No. 6 Poverty Issues in Southern Sri Lanka
No. 7 Urban Poverty in Sri Lanka
No. 8 Gender Dimensions of Poverty in Sri Lanka
No. 9 The Role of International Financial Institutions in Sri Lanka
No. 10 Poverty and Trade Issues in Sri Lanka
No. 11 ශ්‍රී ලංකාවේ ළමා දරිද්‍රතාවය
No. 12 දරිද්‍රතාව සහ වියපත්භාවයේ අභියෝග
No. 13 ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ විශ්ලේෂණය - 2013

cepa
centre for poverty analysis
29, R G Senanayake Mawatha,
Colombo 7, Sri Lanka
Tel:+94 (011) 4690200, 2676955
Fax: +94 (011) 2676 959
E-mail: info@cepa.lk
www.cepa.lk

The Asia Foundation

ThinkTank Initiative

ISBN 978-955-1040-71-0